# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1979/40 - 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34(2) වගන්තිය යටතේ නියමය**

2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මගින්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 6, 9, 14, 16 හා 17 වන වගන්තිවලට සිදු කළ සංශෝධන බලාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම්, වැඩපිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු, ඉහත කී 2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව බලාත්මකව පැවති 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 6, 9, 14, 16 හා 17 වගන්ති සහ එම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක්ම (1990 නොවැම්බර් 20 වන දින අංක 637/6 *අති විශෙෂ ගැසට් පතේ* පළ කරනු ලැබූ 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (අලුත් හැඳුනුම්පත් නිකුත් කිරීමේ) නියෝග හැර, 2017.06.30 වන දින තෙක් තව දුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක වන බව අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය එස්. බී. නාවින්න වන මම 2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නියම කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2016 අගෝස්තු මස 01 දින,
බත්තරමුල්ලේ දී ය.

08 - 768